මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

---------------------------------------------------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට මහනුවර කඩවත්සතර සහ ගඟවට කෝරළේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉදිරි වර්ෂය සඳහා ලද රු.928,469 ක වරිපනම් හා අක්කර බදු කලින් ලද ආදායමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ දී නිවැරදි කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දී, මුද්දර ගාස්තු ආදායම රු.40,045,558 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | මුද්දර ගාස්තු උපලේඛනවල වටිනාකම ගිණුම් තබා ඇත. |
| (ඇ) | රු.1,099,589 ක පොළිය ස්ථාවර තැන්පතු ගිණුමට හර කර නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී, නිවැරදි කිරීම් සිදු කරමි. |
| (ඈ) | මිල දී ගත් රු.418,845 ක් වටිනා ඖෂධ වියදමක් ලෙස හඳුනා ගෙන නොතිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ඉ) | රු.4,516,228 ක් වටිනා ආදායම් වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වා තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2020 වර්ෂයේ දී ආදායමට ගන්නා බව දන්වමි. |

1.3.2 <u>නොසැසඳුනු ගිණුම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 02 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපලේඛන අතර රු.496,228 ක වෙනසක් විය. | ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ රු.844,950 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ රු.103,631,348 ක් ලැබිය යුතුව තිබුණි. | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතු වේ. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ රු.803,538 ක් හා අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබූ රු.5,876,543 ක ශේෂයක් විය. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | වෙන් කර ඇති මුදල් ගෙවිය යුතු පාර්ශවයන්ට ගෙවීමට කටයුතු කරමි. |

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලේඛන, උපලේඛන, කාල විශ්ලේෂණ, කුවිතාන්සි හා ලිපිගොනු වැනි තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.18,669,972 ක් වූ ගිණුම් විෂයයන් 08 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | උපලේඛන, කාල විශ්ලේෂණ සහ ලිපිගොනු විගණනය වෙත වාර්තා කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මු.රෙ.104(4) | 2016 වර්ෂයේ දී, බැකෝ යන්ත්‍රයට සිදු වූ හානිය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | තුන් මසක් ඇතුළත දී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. | මු.රෙ.104 අනුව, පරීක්ෂණය නිම කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව<br>-------------------------- | | | |
| (i) | මූ.රී.154(1) | අනු බෙදුම් කර ඉඩම් විකිණීම මත වන බදු පිළිබඳ ලේඛනයක්, පවත්වා ගෙන ගොස් නොතිබුණි. | අදාළ ආකෘති අනුව, ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | මූ.රී.218 | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | සියලු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කළ යුතු වේ. | ඊළඟ වර්ෂයේ දී, සිදු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | සභාවේ වාහන 05 ක ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වේ. | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කරමි. |
| (ඈ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | වසර 05 කට වරක් වරිපනම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | තක්සේරු ප්‍රතිශෝධනය සිදු කරමින් පවතී. |

1.5 <u>ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------- | --------------- | ------------------------------ |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්තිය ප්‍රකාරව යෝජනා සම්මතයකට අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන, 2014 සහ 2015 වර්ෂවලට අදාළ රු.12,575,034 ක් වටිනා රජයේ ආධාර ශේෂයක් ගිණුමෙන් ඉවත් කර තිබුණි. | ප්‍රාදේශීය සභා පනතට අනුව කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව, අනුමැතියකින් තොරව කපා හැර ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.70,052,175 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,346,908 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018 2017

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 8,930,483 | 9,675,212 | 9,754,153 | 7,275,839 | 8,726,970 | 8,562,664 | 8,729,462 | 7,518,534 |
| (ii) | කුලී | 984,000 | 694,520 | 695,015 | -- | 815,000 | 564,000 | 564,000 | 495 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,947,940 | 5,017,445 | 5,017,444 | -- | 3,906,000 | 1,123,099 | 1,123,099 | -- |
| (iv) | වෙනත් ආදායම් | 38,276,800 | 77,331,607 | 11,124,311 | 126,910,254 | 37,518,000 | 23,187,062 | 31,786,671 | 84,656,882 |
| | එකතුව | 53,139,223 | 92,718,784 | 26,590,923 | 134,186,093 | 50,965,910 | 33,436,825 | 42,203,232 | 92,175,911 |

2.2.2 <u>වරිපනම් හා බදු</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති හිඟ වරිපනම් රු.7,441,754 න් වර්ෂය තුළ සියයට 68 ක ප්‍රමාණයක් අය කර ගෙන නොතිබුණි. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට අය කරමින් පවතී. |
| (ii) | රජයේ ආයතනවලින් අය විය යුතු රු.595,941 ක හිඟ වරිපනම් ශේෂයක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අය විය යුතු වරිපනම් හිඟ ශේෂ අය කර ගත යුතු වේ. | හිඟ වරිපනම් බදු නොපමාව ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. |
| (iii) | සභාව විසින් 2008 න් පසුව දියුණු ප්‍රදේශ හඳුනා ගෙන වරිපනම් අය කිරීමට කටයුතු කර නොතිබුණි. | දියුණු ප්‍රදේශ හඳුනා ගෙන වරිපනම් බදු අය කර ගත යුතු වේ. | වරිපනම් ප්‍රදේශ පුළුල් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. |
| (ආ) | කසළ බදු<br>හිඟ හිටි කසළ බදු රු.59,950 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | කපා හැරීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත. |

2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අය විය යුතු උසාවි දඩ රු.1,339,383 ක් හා මුද්දර ගාස්තු රු.76,708,000 ක් විය. | සභාවට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු වාවස්ථා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය පරිදි කාරණා 08 ක් සඳහා අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍යතාවය මත ඉදිරියේ දී, මෙම අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ඉටු කළ යුතු කාර්යයන් නිශ්චිතව හඳුනා නොගෙන, ප්‍රාග්ධන වියදම රු.31,000,219 ක් ලෙස ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි. | ඉටු කළ යුතු කාර්යයන් නිශ්චිතව හඳුනා ගත යුතු වේ. | ඉදිරි වර්ෂයේ දී, නිවැරදිව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කරමි. |

(ඇ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකර, ටොන් 01 කට රු.500 ක් බැගින් ගෙවා කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව සතු කසළ අංගනයට බැහැර කරමින් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඒ සඳහා රු.299,505 ක් ගෙවා තිබුණි. | විධිමත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු වේ. | සුදුසු ඉඩමක් නොමැති නිසා, මෙසේ කටයුතු කරන අතර, ඉඩමක් ලබා ගැනීමට මූලික කටයුතු සිදු කර ඇත. |

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ 2017 අගෝස්තු 14 දිනැති අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳව විධිමත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීම පිළිබඳව විධිමත් සැලසුමක් පිළියෙල කළ යුතු වේ. | 2019 වර්ෂය සඳහා තිරසර සංවර්ධන සැලැස්ම පිළියෙල කර ඇත. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2003 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අය වීමට ඇති මුද්දර ගාස්තු ශේෂය රු.68,776,756 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවට අය විය යුතු මුද්දර ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | උපලේඛන ලබා ගැනීමට නොහැකි වූ බැවින්, අය කර ගැනීමට නොහැකි විය. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු 06 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | විශ්‍රාම ගිය නිලධාරීන් 03 ගේ රු.18,778 ක් වූ සේවක ඇප නිදහස් කර නොතිබුණි. | ඇප මුදල් අවස්ථානුකූලව නිදහස් කිරීමට කටයුතු කළ යුතු වේ. | එක් නිලධාරියෙකු ඇප නිදහස් කිරීමටත්, අනෙක් නිලධාරීන් දෙදෙනාගේ සේවක ඇප විනය පරීක්ෂණ අවසන් වූ පසුවත් නිදහස් කරන බව දන්වා ඇත. |

3.4 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් 2017 වර්ෂයේ සිදු කළ සමීක්ෂණය මත පදනම්ව 2018 වර්ෂය සඳහා ද ත්‍රීරෝද රථ ගාස්තු අය කර තිබුණි. | වාර්ෂිකව ත්‍රීරෝද රථ සමීක්ෂණයක් කළ යුතු වේ. | 2019 වර්ෂයේ සමීක්ෂණ කටයුතු සිදු කරන බව දන්වමි. |

3.5 <u>වත්කම් කළමනාකරණය</u>

3.5.1 <u>පවරා නොගත් වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිරවුල් කර නොගත් රු.28,764,697 ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි 25 ක් සභාව සතුව පැවතුණි. | ඉඩම් හා ගොඩනැගිලි නිරවුල් කර ගත යුතු වේ. | සභාව සතු දේපළවල ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. |

3.5.2 <u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පරිත්‍යාග ලෙස ලැබී තිබූ ධූමායන යන්ත්‍රයක් 2014 වර්ෂයේ සිට ද, කුබෝටා ජල පොම්පයක් ඇතුළු උපකරණ වර්ෂ 10 කට වැඩි කාලයක සිට ද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන ගබඩාවේ රඳවා තබා තිබුණි. | සභාව සතු වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව නොපැවතීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසු වෙන්දේසි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2010 වර්ෂයේ සිට වටිනාකම හඳුනාගත නොහැකි ජල උපකරණ අයිතම 147 ක් කිසිදු ප්‍රයෝජනයකට නොගෙන විනාශ වීමට ඉඩ හැර පැවතුණි. | නිෂ්කාර්යය හෝ විනාශ වීමට ඉඩ හැරීමට කටයුතු නොකළ යුතු වේ. | තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් පසුව වෙන්දේසි කරන බව දන්වමි. |

3.5.3 <u>වාහන උපයෝජනය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ට්‍රැක්ටරයක් 2015 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබුණි. | අලුත්වැඩියා කර, භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | අලුත්වැඩියා නොකිරීම හේතුවෙන්, ට්‍රැක්ටර් ට්‍රෙලරයක් භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. | අලුත්වැඩියා කර, භාවිතා කිරීමට කටයුතු කළ යුතු වේ. | ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

3.6 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් විවිධ කාර්යයන් සඳහා වෙනත් ආයතනවල තැන්පත් කර තිබූ, රු.277,000 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තැන්පත් කළ මුදල් අවශ්‍ය පරිදි නැවත ලබා ගත යුතු වේ. | පැරණි ලේඛන හා ලදුපත් සොයාගත නොහැකි බැවින්, තැන්පත් මුදල් ආපසු ලබා ගැනීම ප්‍රමාද වෙමින් පවතී. |

3.7 <u>හඳුනාගත් පාඩු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන ලද කර්මාන්තයකට අදාළ ගෙවිය යුතු මුදල රු.204,000 ක් නොගෙවීම එරෙහිව පැවරූ නඩුවේ වියදම් සඳහා රු.140,613 ක මුදලක් සභාවේ නොසැලකිල්ල නිසා වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවූ මුදල අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වගකිව යුතු පාර්ශව හඳුනා ගැනීමට මු.රෙ.104 පරීක්ෂණයන් සිදු කිරීම සඳහා කටයුතු කරන බව දන්වමි. |

3.8 ප්‍රසම්පාදනය

කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කර තිබුණු රු.63,187,395 ක් වටිනා සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණ හා අනෙකුත් කාර්යයන්ට අදාළව විස්තර ඇතුළත් වන පරිදි ලොග් සටහන් පොත් නිවැරදිව නඩත්තු කර නොතිබුණි. | ලොග් සටහන් පොත් නඩත්තු කළ යුතු වේ. | ඉදිරියේ දී, ලොග් පොත් නඩත්තු කරන බව දන්වමි. |